**පරමාණුක බලශක්ති අධිකාරිය - 2014**

**--------------------------------------**

පරමාණුක බලශක්ති අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 19 දරන පරමාණුක බලශක්ති අධිකාරිය පනතේ 32(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පරමාණුක බලශක්ති අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං රා ගි ප්‍ර)**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව, මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන පිළියෙල කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) යන ප්‍රමිතීන් දෙකම යොදා ගෙන තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 7 දේපල, පිරියත හා උපකරණහි දක්වා ඇති පරිදි ශේෂපත්‍ර දිනට තීරණය කළයුතු සාධාරණ අගයෙන්, ධාරණ අගයන් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව තහවුරු කර ගැනීම සඳහා අධිකාරිය විසින් එහි දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද, ප්‍රත්‍යාගණනය කිරීමෙන් තොරව අඛණ්ඩව භාවිතා කළ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් පිළිබඳ ඓතිහාසික පිරිවැය 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 129.39 ක් විය.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ සඳහා නියාමන අයවැයට (Regulatory Budget) අදාළව ගෙවිය යුතු රු.16,826,190 ක් සම්බන්ධයෙන් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරියට (IAEA) ශ්‍රී ලංකා රජය විසින් නිරවුල් කළ යුතු මූල්‍ය වගකීම සඳහා රු.මිලියන 15 ක මුදලක් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණි. කෙසේ වුවද මෙම අරමුදල් යොදා ගනිමින් අධිකාරිය විසින් රු.14,864,257 ක මුදලක් පමණක් නිරවුල් කර තිබූ අතර, ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.1,961,933 ක් විය. තවද අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රදානය හා ගෙවිය යුතු මුදල නිරවුල් කිරීම සඳහා අධිකාරිය විසින් ගෙවන ලද මුදල ගිණුම්ගත කර නොතිබූ අතර අමාත්‍යාංශයෙන් ලැබුණු අරමුදල්වල ශේෂය වූ රු.136,049 පමණක් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු වෙළඳ ශේෂය යටතේ දක්වා තිබුණි.

(ආ) රු.121,144,190 ක් වූ බහු කාර්ය ගැමා විකිරණ පහසුකම් (Multi – Purpose Gamma Irradiation Facility) ව්‍යාපෘතියට යොදා ගන්නා ලද කෝබල්ට් 60 ප්‍රභවයේ 250 KCi හි මුළු මිලදීගැනීම් පිරිවැය අධිකාරියේ ගිණුම්වලට ගෙන නොතිබූ අතර ඒ වෙනුවට 2014 වර්ෂය තුළ අධිකාරිය විසින් දරන ලද රු.33,156,406 ක මුදල හා රු.14,052,726 ක් වූ ක්ෂයවීම් පිරිවැය බහු කාර්ය ගැමා විකිරණ පහසුකම් ව්‍යාපෘති ගිණුමට (MGIF) ගිණුම්ගත කර සමාලෝචිත වර්ෂය අවසානයට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයෙන් (MGIF ව්‍යාපෘතිය)

ලැබිය යුතු මුදල් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මුදල සනාථ කරගෙන නොතිබුණි. කෙසේ වුවද බහුකාර්ය ගැමා විකිරණ පහසුකම් (MGIF) ව්‍යාපෘතියෙන් උපයන ලද ආදායම හා 2014 වර්ෂයේදී එම පහසුකම සම්බන්ධයෙන් අධිකාරිය විසින් දරන ලද වෙනත් වියදම් පිළිවෙලින් රු.44,008,113 ක් හා රු.35,020,267 ක් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එබැවින් 2014 වර්ෂය සඳහා බහුකාර්ය ගැමා විකිරණ පහසුකම් ව්‍යාපෘතියේ ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවලින් සාධාරණව නිරූපනය වී නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල හා ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන මුදල අතර රු.276,517 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

**2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වෙළඳ ශේෂය වූ රු.4,803,479 න් රු.1,867,801 ක මුදලක් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 1 සිට 9 දක්වා කාලයක් හිඟ හිට පැවතුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් විද්‍යාත්මක උපකරණ හා ජංගම නොවන වත්කම් සඳහා අත්තිකාරම් ගෙවීම් යටතේ ඇතුළත් එකතුව රු.9,639,453 ක් වූ විද්‍යාත්මක උපකරණ හා ප්‍රයෝජනයට ගත නොහැකි විෂයයන් සමීක්ෂණය කිරීම පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂය තුළදී අධිකාරියට භාර දෙන ලද රු.13,952,795 ක් වූ විකිරණශීලී ද්‍රව්‍ය සහ වෙනත් සමහර සමාන ද්‍රව්‍ය (වටිනාකම හඳුනාගත නොහැකි) පිළිබඳ භාරකාරීත්වය, බෙදාහැරීම හා උපයෝජනය සහ ඒවා ප්‍රයෝජනයට ගනිමින් සපයන ලද සේවා විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අදාළ ප්‍රතිග්‍රාහක ආයතන හා ප්‍රතිපාර්ශවීය ආයතන පිළිබඳ සම්බන්ධීකරණය සහිතව ලබා දී ඇති කාලපරිච්ඡේදය ඇතුළත අධිකාරිය විසින් ව්‍යාපෘති නිම කිරීම ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය (International Atomic Energy Agency) විසින් අපේක්ෂා කරනු ලැබේ. කෙසේ වුවද ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් අනුමත කරන ලද අරමුදල් උපයෝජනයට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් අධිකාරිය විසින් පහත සඳහන් ක්ෂේත්‍ර පාලනය කිරීමේ කටයුතු පිළිබඳව විගණනයේදී තහවුරු නොවීය.

(i) ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරිය විසින් අනුමත කරන ලද ව්‍යාපෘතිවල කාර්යයන් සහ එහි ප්‍රගතිය සටහන් කිරීම හා වාර්තා කිරීම.

(ii) අනුමත ව්‍යාපෘති සඳහා ප්‍රදාන නියෝජිතායතන විසින් සපයන ලද අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව වෙන්කිරීම සහ උපයෝජනය

(iii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළවන වර්තමාන කාර්යසාධනය

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2014 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය (SLGC) හා නිර්විනාශක පරීක්ෂණ සඳහා ජාතික මධ්‍යස්ථානය (National Centre for Non-destructive Testing) ආදී සමහර අංශවල ස්ථාවර වත්කම්වල පැවැත්ම සත්‍යාපනය කර නොතිබුණි. |
| (ආ) | යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.4 වගන්තිය | දේශීය/විදේශීය පුහුණුව සඳහා පුද්ගලයන් තෝරාගැනීම සම්බන්ධයෙන් පරිපාටි සකස් කිරීම සඳහා අධිකාරිය විසින් පුහුණු පිළිබඳ කමිටුවක් (අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවක්) පත්කර නොතිබුණි. තවද සහභාගී වීම සඳහා වඩාත් සුදුසු නිලධාරීන්ට අවස්ථාව ලබාදීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් නැවත නැවත සහභාගී වීමේ අවස්ථා තිබුණි. |
| (ඇ) | 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | පෙර මුදල් වර්ෂය තුළ පාඩුවක් වාර්තා කරන ලද හා අවසාන මුදල් වර්ෂයට සාපේක්ෂව පාඩුව අඩුකර ගැනීමට නොහැකි වූ රජයේ සංස්ථාවක සේවය කරන සේවකයින් 2014 වර්ෂය සඳහා රු.2,000 ක ප්‍රසාද දීමනා වලට පමණක් හිමිකම් දරනු ලැබේ. කෙසේ වුවද අධිකාරිය විසින් එක් සේවකයෙකුට රු.13,500 බැගින්, ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබූ අතර චක්‍රලේඛ උපදෙස් සැලකීමෙන් තොරව 2014 වර්ෂය සඳහා එසේ ගෙවන ලද මුදල රු.1,705,364 ක් විය. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.25,596,777 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,176,945 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,419,832 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළ මුළු ආදායම රු.50,637,815 කින් හෙවත් සියයට 38.5 කින් වැඩි වී තිබුණද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුළු වියදම රු.61,057,648 කින් හෙවත් සියයට 41.6 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් දායක වූ කරුණ විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**(අ) ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය (Sri Lanka Gamma Centre)**

2006 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස බහුකාර්ය ගැමා විකිරණ පහසුකම් (Multipurpose Gamma Irradiator Facility) ව්‍යාපෘතිය අධිකාරිය විසින් ආරම්භ කරන ලද අතර බියගම අපනයන සැකසුම් කලාපයේ වර්ෂ 30 ක් සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට බදු දෙන ලද පරිශ්‍රය තුළ ස්ථානගත කර තිබුණි. ව්‍යාපෘතියේ වාණිජ කටයුතු 2014 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉඩමේ කල් බදු හිමිකම තවමත් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින බැවින් අධිකාරිය විසින් ආයෝජන මණ්ඩලය (BOI) සමඟ අවබෝධතා ලියවිල්ලකට (MOU) හෝ ගිවිසුමකට එළඹ නොතිබුණි. මෙම ගැමා මධ්‍යස්ථානය සඳහා අමාත්‍යාංශය දරන ලද මුදල රු.මිලියන 746.6 ක් විය.

(ii) මධ්‍යස්ථානයේ අයිතිය 2015 අගෝස්තු 31 වන විටත් අධිකාරියට පවරා ගෙන නොතිබුණි.

(iii) දේශීය වෙළඳපොලට නිෂ්පාදන සපයන සැපයුම්කරුවන් සඳහා සේවා සැපයීම සඳහා පමණක් ප්‍රමාණවත් වන ISO 9001:2008 තත්ත්ව කළමනාකරණ පද්ධතිය (Quality Management System) පමණක් ව්‍යාපෘතිය විසින් ලබාගෙන තිබුණි.කෙසේ වුවද ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන් අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා විශේෂයෙන් වෛද්‍ය ලාංඡන උපකරණවලට (medical devices) අදාළව ජාත්‍යන්තර වෙළඳපොලට අවශ්‍ය දේ සපයන සැපයුම්කරුවන් සඳහා සේවා සැපයීමට අවශ්‍යවන ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිති සහතිකය (ISO 13485:2003 තත්ත්ව කළමනාකරණ පද්ධතිය) ලබා ගැනීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතිය විසින් සේවා සැපයීම රටේ සමස්ත අවශ්‍යතාවය කේන්ද්‍ර කර ගෙන නොතිබුණි. ඉතා ඉහළ තත්ත්ව මට්ටමකින් එම සේවා සපයන වෙනත් සමහර ආයතන වෙළඳපොලෙහි ක්‍රියාත්මක වන බවද තවදුරටත් නිරීක්ෂණය විය.

(iv) ව්‍යාපෘතියේ විකිරණශීලී ප්‍රභවයේ සැලසුම්ගත කාර්යය කියුරිස් (curies) (kci) 3,000 ක් වුවද 250 (kci) විකිරණශීලී ප්‍රභවය පමණක් භාවිතා කර තිබුණි. එබැවින් ව්‍යාපෘතිය විසින් සම්පූර්ණ ධාරිතාවය ප්‍රශස්ත වශයෙන් භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(v) ව්‍යාපෘතියේ සැලසුම් කරන ලද මානව සම්පත් (HR) අවශ්‍යතාවයන් අනුමත සේවක සංඛ්‍යාවට අනුකූල නොවීය. එබැවින් මෙහෙයුම්වල අපේක්ෂිත මට්ටම හා වෙළඳපොල ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වී තිබුණි.

### 4.2 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

ගබඩා ස්වයංක්‍රීයකරණය කිරීමේ අරමුණ සඳහා 2011 වර්ෂය තුළදී රු.389,375 කට මිලදී ගත් පරිගණක මෘදුකාංග පැකේජයක් 2014 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. කෙසේ වුවද එම මෘදුකාංගය අරමුණු කළ කාර්යය සඳහා කිසිසේත්ම භාවිතා කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන කරුණු**

යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 2 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියේ විධිවිධානවලට පටහැනිව තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය විවෘත කිරීමේ උත්සවය සඳහා අධිකාරිය විසින් රු.2,153,424 ක මුදලක් ගෙවා තිබුණි.

**4.4 ඵල රහිත වියදම්**

රු.1,440,000 ක් වූ විකිරණශීලි ද්‍රව්‍ය විෂයයන් 15 ක් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද ඒ හා සමාන ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් තොරව අධිකාරියේ තොගවල පැවතුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

කාලීන සමාලෝචනයක් කිරීම මගින් තාත්වික සේවක සංඛ්‍යා මට්ටමක් පවත්වා ගැනීමට අධිකාරියට නොහැකි වීම පෙන්නුම් කරමින් 2014 වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිවල තනතුරු 4 ක්, ද්වීතිය ශ්‍රේණිවල තනතුරු 23 ක් හා ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරු 12 ක් ඇතුළත් විවිධ සේවක වර්ගවල පුරප්පාඩු 39 ක් නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය එක් නිලධාරියෙකුගෙන් පමණක් සමන්විත වී තිබූ අතර අතිරේක වැඩ ප්‍රමාණයක්ද අභ්‍යන්තර විගණකට පවරා තිබුණි. ඒ අනුව ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය නියාමනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යයන් සුදුසු පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය

**5.2 විගණන කමිටුව**

විගණන කමිටුව විසින් කරන ලද නිර්දේශයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිචාර නොදැක්වීම් අවස්ථා නිරීක්ෂණය වි

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

අධිකාරිය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට හා අයවැය ලේඛනයට අනුකූල නොවිය.

**5.4 අයවැය පාලනය**

අයවැයගත හා තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදි නිරීක්ෂණය වූ සැලකිය යුතු පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) දේපල, පිරියත හා උපකරණ පිළිබඳ පාලනය
(ආ) ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු මුදල්
(ඇ) නීති,රීති ආදියට අනුකූල වීම.
(ඈ) ප්‍රසම්පාදනයන්
(ඉ) සම්පත් උපයෝජනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) වත්කම් කළමනාකරණය
(ඌ) අයවැය පාලනය